මගේ අංකය : නව-SG/Admin/5/18-Annual Transfer(External)-2020
ඒකාබද්ධ සේවා අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ - 05.

2019.12.18 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්/අධ්‍යක්ෂ(මැ.සි.ආ.)/අධ්‍යක්ෂ (මුදල්)/ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,

**2020 වාර්ෂික ස්ථාන මාරුවීම් - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I,II,III ශ්‍රේණි)**

උක්ත මැයෙන් වූ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPubAd/AcSD/Ann.Transfer 2020 හා 2019.11.29 දිනැති වාර්ෂික ස්ථාන මාරු නියෝග පහත දැක්වේ.

02. ඒ අනුව ඔබ කාර්යාලයට/අංශයට අනුයුක්තව සේවය කරන ගණකාධිකාරී සේවයේ නිලධාරීන් දැනුවත් කර, අදාල ස්ථාන මාරු නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

03. වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන්ගේ අභියාචනා 2019.12.13 දින හෝ ඊට පෙර මා වෙත ලැබීමට සැලැස්විය යුතුය. (වැඩි විස්තර සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ උක්ත ලිපිය බලන්න)

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I,II,III ශ්‍රේණි) – 2020 වාර්ෂික ස්ථාන මාරු තීරණ

| කාණ්ඩ අංකය | ගොනු අංකය | නම, තනතුර හා ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | නව සේවා ස්ථානය | අනුප්‍රාප්තිකයාගේ නම, ශ්‍රේණිය හා වර්තමාන සේවා ස්ථානය | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 108 | 1407 | ආර්.එම්.ඊ.ජී.කේ. ගොකරුල්ල මිය (ප්‍රධාන අභ්‍යන්තර විගණක - ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණිය | ප්‍රධාන කාර්යාලය | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | I ශ්‍රේණියට උසස් කිරීම් මගින් අනුප්‍රාප්තිකයා ලබා දෙනු ලැබේ. | ස්ථාන මාරු 2020.02.20 දින සිට ක්‍රියාත්මක වේ. |
| 205 | 2512 | ටී.ඩී. දේවපුර මිය (ගණකාධිකාරී III ශ්‍රේණිය) | බස්නාහිර පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | මුදල් අමාත්‍යාංශය | ඩබ්.එච්.ඒ. විමලජීව මිය (ගණකාධිකාරී III ශ්‍රේණිය, මුදල් අමාත්‍යාංශය) | ස්ථාන මාරු 2020.02.10 දින සිට ක්‍රියාත්මක වේ. |

එස්.එම්.පී.පී. සංගක්කාර
සර්වේයර් ජනරාල්

එස්. එම්. පී. පී. සංගක්කාර
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | MPubAd/AcSD/Ann.Transfer 2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2019.11.29 |

අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
කොමිෂන් සභා ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**2020 - වාර්ෂික ස්ථාන මාරුවීම්**
**(ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I,II,III ශ්‍රේණි)**

මේ සමඟ අමුණා ඇති උපලේඛණයේ සඳහන් මාරුවීම් එහි සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. මේ සමඟ ඇති ස්ථාන මාරුවීම් නියෝග, මාරුවීම් ඉල්ලා ඇති/ මෙහි නම් සඳහන් ඔබ ආයතනයේ සියළුම නිලධරයන්ට දැනගැනීමට සලස්වා, නියමිත දිනයේ අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාරගන්නා ලෙස ඔවුන්ට දැනුම්දෙනු මැනවි. මෙම වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් පෙර පැවති අමාත්‍යාංශ නාමයන් අනුව සකස් කර ඇති අතර ඉදිරියේදී ගැසට් නිවේදනයන් මඟින් ප්‍රකාශ කරනු ලබන අමාත්‍යාංශ විෂය පථයයන් අනුව ඔබගේ අමාත්‍යාංශය සංශෝධනය විය හැකි බව කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරුවීම් කිරීමේදී මාරුවීම් කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පටිපාටිය 2019.07.08 දිනැති අංක 20/2019 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් මේ වන විටත් ඔබ වෙත දන්වා ඇති අතර, මෙම නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2019 හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පාටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේ අවධානයට යොමුවී නොමැත්තේ නම් පමණක් ඒ අනුව අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

03. අභියාචනා ඉල්ලුම් පත්‍රයෙහි ආදර්ශ අයදුම්පතක් මේ සමඟ අමුණා ඇත. අභියාචනා සම්බන්ධයෙන් සළකා බැලීමට එම ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සකස්කරගත් ඉල්ලුම්පත් **2019.12.13** දිනට ප්‍රථම එවන මෙන් කරුණාවෙන් දන්වමි. එදිනට පසුව ලැබෙන අභියාචනා සළකා නොබලන බවද අදාළ නිලධරයන්ට දැන්විය යුතුවේ. තවද ස්ථාන මාරු ලේඛණයේ අදාළ නිලධරයා ඉදිරියෙන් සඳහන් කර ඇති අනන්‍යතා අංකය (File No.) අභියාචනා ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර නොමැති අයදුම්පත් සළකා නොබලන බවද දන්වමි.

04. ඔබ අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන්/පළාත් සභාවෙන්/ආයතනයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන්, **අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන** නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීමට හැකිවන සේ මුදාහැරීමට කටයුතු කරන ලෙස දන්වමි.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය

ස්ථාන මාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය.........................................

ආකෘති අංක 04

## 2020 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ස්ථාන මාරුවීම් - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය

අමාත්‍යාංශය..................................................

දෙපාර්තමේන්තුව...........................................

01.

i. නිලධරයාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්)

.................................................................................................................මයා/ මිය/මෙනෙවිය

ii. ස්ථිර ලිපිනය.......................................................................................................................

iii. වර්තමාන පදිංචි ස්ථානයේ ලිපිනය......................................................................................

iv. 2020 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය...................................

.........................................................................................................................................

02. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථාන...........................................................................................

03. තනතුර හා ශ්‍රේණිය.................................................................................................................

3.1 සේවයට ඇතුලත් වූ දිනය..........................................................................................

3.2 ශ්‍රේණියට ඇතුලත් වූ දිනය.........................................................................................

04. උපන්දිනය...............................................................................................................................

2019.12.31 දිනට වයස අවු..................................

| 05. සේවා විස්තර | පත්වූ දිනය | සේවා ස්ථානය - සිට/ දක්වා |
|---|---|---|
| ........................................ | ................................. | ................................................ |
| ........................................ | ................................. | ................................................ |
| ........................................ | ................................. | ................................................ |

06. මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථානමාරුවීම අවලංගු කිරීමටය/ සංශෝධනය කිරීමටය

07. අභියාචනා කිරීමට හේතු (පසුපිටෙහි සඳහන් කරන්න)

08. ස්ථානමාරුව සංශෝධනය කළ යුතු/ ලබාදිය යුතු සේවා ස්ථානය

අමාත්‍යාංශය.............................................................................................................

දෙපාර්තමේන්තුව.......................................................................................................

දිනය.........................

......................................

නිලධරයාගේ අත්සන

(අ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ

i. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ

ii. මෙම ස්ථානමාරුව අවලංගු කිරීම/ සංශෝධනය කිරීම සම්බන්ධයෙන්වන කරුණු දැක්වීම හා නිර්දේශය

දිනය.........................

..........................................................................

අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

( අනවශ්‍ය වචන කපාහරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුලත් නොකල අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසු පිටෙහි සඳහන් කරන්න)